# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1990 අංක 21 දරන
# අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1990 ජූනි මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1990 ජූනි මස 15 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 30 යි. තැපැල් ගාස්තුව : රු. 1.00 යි

# 1990 අංක 21 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1990 ජූනි මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 37/89

**1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත 1990 අංක 21 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1984 අංක 11 දරන පනතේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1984 අංක 11 දරන අන්තරායදායක ඖෂධ පාලනය කිරීමේ ජාතික මණ්ඩලය පනතේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(අ) ඒ වගන්තියේ (ඊ) ඡේදයේ "පවත්වාගෙන යාම; සහ" යන වචන වෙනුවට "පවත්වා ගෙන යාම;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ වගන්තියේ (උ) ඡේදයේ "සම්බන්ධතා පවත්වා ගෙන යාම." යන වචන වෙනුවට "සම්බන්ධතා පවත්වා ගෙන යාම; සහ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ වගන්තිය අගට පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන් :—

"(ඌ) චංචල හෝ නිශ්චල දේපළ කිසිවක් අත්කර ගැනීම, ඇරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම සහ විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 13 වන අලුත් වගන්තිය එකතු කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් එකතු කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 13 වන වගන්තිය වශයෙන් බලාත්මක විය යුතු ය :—

"මණ්ඩලයට රජයේ දේපළ සම්බන්ධයෙන් විශේෂ ප්‍රදාන හෝ බදු දීම.

13. රජයේ නිශ්චල දේපළ කිසිවක් මණ්ඩලයේ කාර්ය සඳහා අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ ඒ දේපළ සම්බන්ධයෙන් වූ විශේෂ ප්‍රදානයක් හෝ බද්දක් කරනු ලැබිය හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද ඒ අනුව මණ්ඩලයට ඒ දේපළ සම්බන්ධයෙන් වූ විශේෂ ප්‍රදානයක් හෝ බද්දක් දීමට ඒ ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.".

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 177 කි. (විදේශීය) රු. 236 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.